# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION


සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 373 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 02/03/2024<br>පැය 1505 |

## මාධ්‍ය නිවේදනය

**01. වෙඩි තබා බරපතල තුවාල සිදුකර මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශණ කාර්යංශය.**

2024.02.19 වන දින බොරැල්ල පොලිස් වසමේ ආනන්ද රාජකරුණා මාවතේ පදිංචි පුද්ගලයෙකුට ගිනි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමට තැත්කිරීමේ සම්බන්ධයෙන් කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය විසින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

2024.03.01 වන දින ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ සේදවත්ත ප්‍රදේශයේදී කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශණ කාර්යංශයේ නිලධාරීන් විසින් ඉහත අපරාධය සිදුකිරීමට භාවිතා කළ යතුරුපැදියේ පැදිකරු, යතුරුපැදියද සමඟ අත්අඩංගුවට ගෙන බොරැල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන සේදවත්ත, වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. වරෙන්තුකරුවෙකු අත්අඩංගුවට ගැනීම - සමන්තුරය පොලිස් ස්ථානය.**

2024.03.01 වන දින සමන්තුරය පොලිස් වසමේ විශේෂ වරෙන්තු ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුමක් ආරම්භ කර දින වරෙන්තු 04 ක් හා විවෘත වරෙන්තු 02 ක් සඳහා අවශ්‍යව සිටි සැකකරුවෙකු තියටර් පාර, සමන්තුරය ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වන සමන්තුරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු හට සමන්තුරය, කල්මුණ, පුත්තලම, වාලච්චේන ගරු මහේස්ත්‍රාත් අධිකරණ වල විභාග වන නඩු සඳහා ඉහත වරෙන්තු නිකුත් කර ඇති බවට අනාවරණය වී ඇත. සමන්තුරය පොලිසිය  වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - මුලතිව් පොලිස් වසම.

2024.03.01 වන දින සවස් කාලයේ මුලතිව් පොලිස් වසමේ මුලතිව් කෝකිලායි මාර්ගයේ අලම්පිල් හංදිය අසලදී අලම්පිල් සිට කුරුඳුමලේ දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි තවත් යතුරුපැදියක මුහුණට මුහුණ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරුවන් දෙදෙනා සහ පසු පැදිකරුවෙකු මාන්චෝල රෝහලට ඇතුලත් කර ඇත. පසුව පැදිකරුවන් දෙදෙනා වැඩිදුර ප්‍රතිකාර සඳහා යාපනය රෝහලට ඇතුලත්ව ප්‍රතිකාර ලබමින් සිටියදී එක් පැදිකරුවෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වූ සෙම්මලේ, අලම්පිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මුලතිව් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**